# සාම්ප්‍රදායික දැනුම හා බැඳි කෙම්ක්‍රම ග්‍රාමීය ජන පැවැත්මට සිදු කරනු ලබන බලපෑම පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

*එච්.එම්.ජී.කේ.ටී. හේරත්*[1]

කෙම්ක්‍රම පාරම්පරික ගැමි විශ්වාසය හා අත්දැකීම් මත පදනම් වූ සුවිශේෂී රහසිගත ක්‍රමවේදයකි. මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් ප්‍රදේශයක ග්‍රාමීය ජනයා සතු සාම්ප්‍රදායික දැනුම හා බැඳි කෙම්ක්‍රම ඔවුන්ගේ ජන ජීවිතයට කෙසේ බලපා ඇත් ද යන්න මෙහි අධ්‍යයන ගැටලුවයි. එම ග්‍රාමයේ ජනයා සතු කෙම්ක්‍රම පුද්ගල ජීවිතයට බද්ධ වී ඇති ආකාරය හා ඒවායෙහි වර්තමාන භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. පර්යේෂණ ක්‍රමවේදය වසයෙන් ගුණාත්මක ක්‍රමවේදය හා සම්මුඛ සාකච්ඡා සිදු කෙරිණි. මෙහි දී වයස 70ට වැඩි පුද්ගලයන් 3ක් හා පාරම්පරික වෙද මහත්තුරු 2ක් සමඟ සම්මුඛ සාකච්ඡාවන් පැවැත්වූ අතර තේමාත්මක විශ්ලේෂණය යටතේ කෘෂිකර්මාන්තය, සත්ත්ව දෂ්ටන, සුළු අසනීප යන තේමා යටතේ දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි. ඒ අනුව ගෝනුස්සෙකු දෂ්ටනයක දී හැඳ සිටින ඇඳුම කණපිට පෙරලා ඇඳගැනීම, සර්ප දෂ්ටනයක දී කෙස් රොදක් ගලවා එම ස්ථානයට මදක් ඉහළින් ගැට ගැසීම, ඇසේ නගනයක් හටගත් විට පාන්දර අවදි වී නිශ්ශබ්දව මැටි කලයකට ලුණු කැටයක් දැමීම, කුඹුරෙහි වී ඉසීමෙන් අනතුරු ව වක්කඩයෙහි කොළ අත්තක් සිටුවීම, ගම්මිරිස් කරලේ නාරටිය පයට පෑගෙන පරිදි පාරට දැමීම, හරකුන්ගේ කටුවාකෑම වලක්වා ගැනීමට ඖෂධ ගෙනවිත් දුමේ තැබීම ආදි කෙම්ක්‍රම බහුල ව භාවිත කර ඇත. පර්යේෂණ ආචාරධර්මයන්ට අනුව සහභාගීවූවන්ගේ අනන්‍යතාව හෙළි නොකිරීම, ග්‍රාමය හෙළි නොකිරීම, ඔවුන්ගේ කැමැත්ත සහිත ව තොරතුරු ලබා ගැනුණි. වර්තමානයේ කෙම්ක්‍රම භාවිතය යහපත් වුවත්, අයහපත් වුවත් ගැමියන්ගේ විශ්වාසය මත අදටත් භාවිත කරනු ලබයි. අසනීපයක දී කෙම්ක්‍රම විශ්වාස කොට රෝහලෙන් ප්‍රතිකාර නොගැනීමට ගැමියන් පෙළඹී ඇත. ඒ අනුව නිගමනයන් වසයෙන්, වර්තමානයේ එම ප්‍රදේශයේ ජන ජීවිතය තුළ තාක්ෂණය දියුණු වුවත් කෙම්ක්‍රම භාවිතය අදටත් සිදු කරයි. පරම්පරාවේ විශ්වාසය මත කෙම්ක්‍රම මූලික ප්‍රතිකාරවලට යොමු වීමට පෙර සිදු කරනු ලබන ගුප්ත රහස් ක්‍රමයක් වසයෙන් ද භාවිත කරයි. කෙම්ක්‍රම ඉතා සරල වන අතර එදිනෙදා ජීවිතයේ විවිධ ගැටලුවලට විසඳුම් ලබාදීමක් ලෙස පිළිගැනේ.

***ප්‍රමුඛ පද:*** කෙම්ක්‍රම, ග්‍රාමය, ජන ජීවිතය, දෂ්ටන, වර්තමාන

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. krishanthiherath06@gmail.com